කලාප අධ්‍යාපන කාර්යාලය - මාවනැල්ල කලාප අධ්‍යාපන කාර්යාලය - මාවනැල්ල කලාප අධ්‍යාපන කාර්යාලය
Zonal Education Office - Mawanella Zonal Education Office - Mawanella Zonal Education Office

**කලාප අධ්‍යාපන කාර්යාලය - මාවනැල්ල**
Zonal Education Office - Mawanella

**දෙවන වාර පරීක්ෂණය**
2nd Term Test **- 2024**

| | | |
|---|---|---|
| **ශ්‍රේණිය** Grade } **09** | **විෂයය** Subject } **ගණිතය** I, II | **කාලය** Time } **පැය 02 $\frac{1}{2}$** |

**නම :** ........................................................................................................................................

I කොටස
ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01) පහත දැක්වෙන සංඛ්‍යා රටාවේ හිස්තැන්වලට සුදුසු පද ලියන්න.

47, 42, 37, ........... , 27, ...........

02) $x = \frac{1}{5}$ වන විට, $(-10x)$ හි අගය සොයන්න.

03) ධාරිතාව $3l$ වූ භාජනයක් සම්පූර්ණයෙන් පිරවීමට ධාරිතාව $75ml$ වූ කෝප්පයකින් ජලය පිරවිය යුතු අවම වාර ගණන කීයද?

04) විද්‍යාත්මක ගණකය භාවිතයෙන් $\sqrt{6.25}$ හි අගය ලබා ගැනීමට ගණකයේ යතුරු ක්‍රියාත්මක කළ යුතු ආකාරය පහත රූපසටහනේ දැක්වේ. එහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

[ON] ⟶ [ ] ⟶ [6] ⟶ [.] ⟶ [2] ⟶ [5] ⟶ [ ] ⟶ [2.5]

05) විසඳන්න. $\frac{x}{5} - 6 = 3$

06) දී ඇති රූපයේ AB සරල රේඛාවකි. දී ඇති දත්ත ඇසුරින් $a$ හි අගය සොයන්න.




07) $29_{\text{දහය}}$ ද්වීමය සංඛ්‍යාවක් ලෙස ලියන්න.

08) ත්‍රිකෝණයක අභ්‍යන්තර කෝණවල විශාලත්වය අතර අනුපාතය 5 ඃ 6 ඃ 7 වේ. එහි විශාලම කෝණයේ අගය සොයන්න.

09) සාධක සොයන්න. $81 - x^2$

10) පතුලේ වර්ගඵලය 160$cm^2$ වූ ඝනකාභ හැඩති භාජනයක ජලය 800m$l$ ක් ඇත. භාජනයේ ජලය පිරී ඇති උස සොයන්න.

11) $y = mx + c$ සූත්‍රයේ m උක්ත කරන්න.

12) අගය සොයන්න. $\frac{8}{15}$ න් $1\frac{1}{4}$

13) අගය සොයන්න. $3^2$ x $5^0$

14) ABC සෘජුකෝණික ත්‍රිකෝණයකි. පහත දී ඇති සම්බන්ධතා අතරින් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

i) $AB^2 = AC^2 + BC^2$

ii) $BC^2 = AB^2 + AC^2$

iii) $AC^2 = AB^2 + BC^2$




15) පහත රූපය ඇසුරෙන් හිස්තැන් සම්පූර්ණ කරන්න.

AD = CB නම්,

AD - CD = CB - .............. (ප්‍රත්‍යක්ෂය)

∴ AC = ...............




16) ශිෂ්‍යයෙකුගේ උස 1.37m වේ. ඔහුගේ උස

i) පළමු දශමස්ථානයට

ii) ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටයන්න.

17) පහත දී ඇති ප්‍රස්තාරයේ AB මගින් දැක්වෙන සරල රේඛාවේ සමීකරණය ලියන්න.




18) අභ්‍යාස පොත් 12ක මිල රු. 900 නම් එවැනි පොත් 5ක මිල සොයන්න.

19) රූපයේ දී ඇති තොරතුරු අනුව $x$ හි අගය සොයන්න.




20) රූපයේ දැක්වෙන්නේ ABC ත්‍රිකෝණාකාර ඉඩමක දළ සටහනකි. එහි AB හා BC මායිම්වලට සමදුරින්ද AC මායිම මත පිහිටන පරිදිද P නම් ස්ථානයක පහන් කණුවක් සිටුවීමට අවශ්‍යව ඇත. පථ පිළිබඳ දැනුම භාවිතයෙන් P ලක්ෂ්‍යය රූපයේ ලකුණු කරන්න.



II කොටස

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 12ක් හිමිවේ.

01) *a*) (i) සුළු කරන්න. $\frac{4}{7}$ න් $\left(2\frac{3}{4} \div 5\frac{1}{2}\right)$ (ල. 03)

(ii) වෙළඳසැලක ඇති නිමි ඇඳුම් තොගයකින් $\frac{2}{7}$ ක් පළමු දිනයේද, $\frac{1}{3}$ ක් දෙවන දිනයේද විකුණනු ලැබුවේ නම් ඉතිරි ඇඳුම් ප්‍රමාණය මුළු ඇඳුම් ප්‍රමාණයෙහි භාගයක් ලෙස දක්වන්න. (ල. 03)

b) A වෙළඳසැල | B වෙළඳසැල

| A වෙළඳසැල | B වෙළඳසැල |
|---|---|
| රු. 1000 ට වැඩි සෑම බිල්පතක් සඳහාම රු. 100 ක මිළ අඩු කිරීමක් | සෑම බිල්පතක් සඳහාම 8% ක වට්ටමක් |

A හා B වෙළඳසැල් දෙකක ඉහත දැන්වීම් ප්‍රදර්ශනය කර තිබෙනු දක්නට ලැබුණි. ඒ ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) A වෙළඳසැලෙන් රු. 1800 ක භාණ්ඩ මිලදී ගන්නා නෙත්මිට ගෙවීමට සිදුවන මුදල කීයද? (ල. 01)

(ii) එම වටිනාකමින් යුතු භාණ්ඩම B වෙළඳසැලෙන් මිලදී ගතහොත් නෙත්මිට ගෙවීමට සිදුවන මුදල කොපමණ ද? (ල. 03)

(iii) වඩා වාසිදායක කුමන වෙළඳසැලෙන් භාණ්ඩ මිලදී ගැනීමද යන්න හේතු සහිතව පැහැදිලි කරන්න. (ල. 02)

02) $y = -2x + 1$ ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීම සඳහා වූ අසම්පූර්ණ අගය වගුවක් පහත දැක්වේ.

| $x$ | -3 | -2 | -1 | 0 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|
| $y$ | 7 | 5 | 3 | ........ | -1 | ........ | -5 |

(i) $x = 0$ හා $x = 2$ වන විට y හි අගයයන් සොයන්න. (ල. 02)

(ii) ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය සුදුසු ඛණ්ඩාංක තලයක අඳින්න. (ල. 03)

(iii) ඉහත ශ්‍රිතයේ. *a*) අනුක්‍රමණය
*b*) අන්තඃ ඛණ්ඩය සොයන්න. (ල. 02)

(iv) $y = 4$ රේඛාව ඉහත ඛණ්ඩාංක තලයේම ඇඳ එම රේඛාව හා ප්‍රස්තාරය ඡේදනය වන ලක්ෂ්‍යයේ ඛණ්ඩාංක ලියන්න. (ල. 03)

(v) ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරයට සමාන්තරවූත් අන්තඃ ඛණ්ඩය (-1) වූත් ශ්‍රිතයේ සමීකරණය ලියන්න. (ල. 02)

03) *a*) පහත රූපයේ දී ඇති තොරතුරු අනුව අසා ඇති ප්‍රශ්නවලට හේතු දක්වමින් පිළිතුරු සපයන්න. AF හා BF සරල රේඛා වේ.

(i) $x$ හි අගය සොයන්න. (ල. 02)

(ii) $y$ හි අගය සොයන්න. (ල. 02)

(iii) $z$ හි අගය සොයන්න. (ල. 02)



b) ABC ත්‍රිකෝණයේ BC පාදය D තෙක් දික්කර ඇත. රූපයේ දී ඇති තොරතුරු ඇසුරින් පහත දී ඇති සටහනේ හිස්තැන් සම්පූර්ණ කරන්න.




s + r = ............. (සරල රේඛාවක් මත පිහිටි බද්ධ කෝණ)
p + q + r = ............. (..............................................................)
....... + r = p + q + ............
s + r - r = p + q + r - r
............. = p + q

(ල. 1 x 6)

04) *a*) (i) සුළු කරන්න. $\frac{8b^6 \text{ x } 3b^{-2}}{6b^3}$ (ල. 03)

(ii) අගය සොයන්න. $\frac{(3^2)^3 \text{ x } 3^3}{3^0 \text{ x } 3^5}$ (ල. 03)

b) (i) 2023 වර්ෂය අවසන් වන විට ශ්‍රී ලංකාවේ ජනගහනය ආසන්න වශයෙන් $2.218 \text{ x } 10^7$ විය. එම සංඛ්‍යාව සාමාන්‍ය ආකාරයෙන් ලියා දක්වන්න. (ල. 02)

(ii) සෙල්ලම් බඩු කර්මාන්ත ශාලාවක දිනකදී නිෂ්පාදනය කරන බෝනික්කන් ගණන 5500 කි. දින 30ක් සහිත මාසයක නිෂ්පාදනය කරන බෝනික්කන් ගණන සොයා එම සංඛ්‍යාව විද්‍යාත්මක අංකනයෙන් දක්වන්න. (ල. 04)

05) cm / mm පරිමාණය සහිත සරල දාරය හා කවකටුව භාවිතා කර නිර්මාණ රේඛා පැහැදිලිව දක්වමින් පහත නිර්මාණ කරන්න.

(i) XY = 8cm ද XZ = 6cm ද $Y\hat{X}Z = 90^0$ ද වන පරිදි ත්‍රිකෝණය නිර්මාණය කරන්න. (ල. 03)
(ii) XY හි ලම්බ සමච්ඡේදකය නිර්මාණය කර එය XY ඡේදනය වන ලක්ෂ්‍යය P ලෙස නම් කරන්න. (ල. 03)
(iii) එම ලම්බ සමච්ඡේදකය YZ හමුවන ලක්ෂ්‍යය O ලෙස නම් කර. O කේන්ද්‍රයද, OY දුර අරයද වන වෘත්තය නිර්මාණය කරන්න. (ල. 03)
(iv) වෘත්තයේ අරය මැන ලියන්න. (ල. 01)
(v) XZ හා OP රේඛා සමාන්තර වීමට හේතු දක්වන්න. (ල. 02)

06) *a*) (i) විසඳන්න. $\frac{4m}{5} - 1 = 3$ (ල. 03)

(ii) විසඳන්න. $a + 3b = 11$ (ල. 04)
$2a - 3b = 4$

b)




(i) ABC සෘජුකෝණික ත්‍රිකෝණයේ කර්ණය නම් කරන්න. (ල. 01)

(ii) AC = 13cm හා BC = 5cm වන විට AB පාදයේ දිග සොයන්න. (ල. 04)

07) *a*) රූපයේ දැක්වෙන්නේ ABCD සෘජුකෝණාස්‍රාකාර කොටසකින් සහ DC විශ්කම්භය වූ අර්ධ වෘත්තාකාර කොටසකින් සමන්විත වූ ක්‍රීඩා පිටියකි.




(i) අර්ධ වෘත්තාකාර කොටසේ අරය සොයන්න. (ල. 01)

(ii) අර්ධ වෘත්තාකර කොටසේ චාප දිග සොයන්න. (ල. 03)

(iii) ක්‍රීඩා පිටියේ පරිමිතිය සොයන්න. (ල. 02)

b) පුද්ගලයෙක්, තීරු බදු රහිත වෙළඳසැලකින් ශ්‍රී ලංකා රුපියල් 64000 ක් වටිනා රූපවාහිනී යන්ත්‍රයක් ඇමරිකන් ඩොලර් 200ක් ගෙවා මිලට ගන්නා ලදි.

(i) එදින ඇමරිකන් ඩොලරයක වටිනාකම ශ්‍රී ලංකා රුපියල් කීයද? (ල. 03)

(ii) ඔහුට ඇමරිකන් ඩොලර් 125ක් වටිනා දුරකථනයක් මිලදී ගැනීම සඳහා ගෙවීමට සිදුවන මුදල ශ්‍රී ලංකා රුපියල් කීයද? (ල. 03)


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න